2024 අගෝස්තු 19 'සමාජවාදී ජනතා සංසදයේ' දෙවන සම්මේලනය සංශෝධනය කළ ව්‍යවස්ථාව

# ජනඅරගල සංධානයේ ව්‍යවස්ථාව

සමාජවාදී ජනතා සංසදය
නො: 136, පන්සල පාර
කළුතර උතුර

## 1. නම

'ජනඅරගල සංධානය' වේ.

මින්පසු මෙහි එය 'සංධානය' යනුවෙන් සඳහන් කරනු ලැබේ.

## 2. ලියාපදිංචි කාර්යාලය

අංක 136, පන්සල පාර, කළුතර උතුර, ශ්‍රී ලංකාව. වේ.

## 3. පරමාර්ථයෝ

ශ්‍රී ලංකාවේ පවත්නා ධනවාදී සමාජ ක්‍රමය විප්ලවීය වෙනසකට ලක් කොට සමාජයේ පීඩිත වැඩ කරන ජනතාවගේ විප්ලවකාරී බලයක් ගොඩ නැගීම තුළින් සමාජවාදී සමාජයක් නිර්මාණය කිරීම සඳහා සටන් කිරීම.

ඒ සඳහා ලංකාවේ සංවිධිත, අසංවිධිත, කම්කරු, ගොවි, ධීවර ජනයා හා දමිළ, මුස්ලිම්, සෙසු පීඩිත හා ආන්තිකකරණයට ලක්වූ ජනයා බලගන්වා, ඔවුන්ගේම වූ දේශපාලන ව්‍යාපාරයක් තුළින් සමානාත්මතාවය, සාධාරණත්වය, මානුෂිකත්වය, ප්‍රජාතන්ත්‍රවාදය සහ පාරිසරික සංරක්ෂණය සහතික කෙරෙන සමාජයක් බිහිකිරීම වෙනුවෙන් සටන් වැදීම. ඒ සඳහා වැඩකරන ජනතා රාජ්‍ය බලයක් වෙනුවෙන් වැඩකරන ජනතාව මෙහෙයවීම.

ඒ ඒ වෘත්තීන්, අතර සමාන නියෝජනයන් ප්‍රකාශ වෙන පරිදි නියෝජන දේශපාලන සභාවක් මගින් රට පාලනය කෙරෙන ජනතා නියෝජිත ව්‍යවස්ථාදායක සභාවක් පිහිටුවීම සඳහා අරගල කිරීම.

ලෝක බල කඳවුරුවලින් මිදී, කලාපීය හා ජාත්‍යන්තර වශයෙන් සමාන දේශපාලන ව්‍යාපාරයන් සමඟ හරිත සමාජවාදී ලෝකයක් වෙනුවෙන් පොර බැදීම.

ජාත්‍යන්තර නිර්ධන පංති අරගලයේ අත්දැකීම් යොදා ගනිමින් පංති අරගලයේ ජාත්‍යන්තර සහයෝගිතාවය ගොඩනැගීම සහ නිර්ධන පංති ජාත්‍යන්තරවාදය නගා සිටුවීම වෙනුවෙන් මැදිහත්වීම.

## 4. සාමාජිකත්වය

සාමාජිකයෙකු හට වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දැරිය නොහැක.

සාමාජිකාව හෝ සාමාජිකයා සංධානයේ ශාඛාවකට සම්බන්ධ විය යුතු අතර තීරණ ගැනීමේදී ඡන්ද බලය හිමිවේ. ඇයට හෝ ඔහුට සංධානයේ මධ්‍යම කාරක සභාවට තරඟ කිරීමට හිමිකම තිබේ.

විදේශගත සහෝදරවරුන්ගේ සාමාජිකත්වය ශ්‍රේණිගත කිරීම මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත් විය යුතුය.

මධ්‍යම කාරක සභාවේ විශේෂ අනුමැතියකින්, සංධානයේ විවෘත සාමාජිකයෙකු නොවිය යුතු යැයි තීරණය කරන අවස්ථාවක හැර, ඔහු හෝ ඇය සංධානයේ ශාඛාවකට සම්බන්ධ වී ක්‍රියා කළ යුතුය.

## 5. සංධානයේ ශාඛා

වෘත්තීය මට්ටමේ හෝ ඕනෑම භූගෝලීය පදනම මත සංධානයේ ශාඛා ගොඩ නැංවිය හැකිවේ. සංධානයේ ශාඛා කිහිපයක් එකතු වී දිස්ත්‍රික් සභාවක් ලෙස කටයුතු කිරීම මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත් වේ.

## 6. සම්මේලනය

CamScanner

සංධානයේ උත්තරීතර මණ්ඩලය වන්නේ නියෝජිත මහා සම්මේලනයයි. වසර දෙකකට වරක් මහා සම්මේලනය පැවැත්විය යුතුය. සංධානයේ ඉදිරි දර්ශනය හා දේශපාලන ක්‍රියාමාර්ගයන් තීරණය කිරීමේ බලය සම්මේලනය සතු වේ. දේශපාලන යෝජනාව, ජාත්‍යන්තර යෝජනාව හා සංවිධායක යෝජනාව ඒ සඳහා මග පෙන්වනු ලබයි.

සමාජිකත්වයේ 1/3 ක පිරිසක් ඉල්ලා සිටින අවස්ථාවකදී හෝ විශේෂ තත්වයන් තුළ මධ්‍යම කාරක සභාවේ බහුතර අනුමැතියකින් අතරමැදි සම්මේලනයක් ඉල්ලා සිටින අවස්ථාවකදී විශේෂ සම්මේලනයකට හිමිකම ලැබේ.

සම්මේලනයේ ගණ පූරණය සාමාජිකත්වයෙන් 1/3 විය යුතුය.

හදිසි සම්මේලනයක් අවස්ථාවක දී හැර සම්මේලනයේ සාකච්ඡාවට ගනු ලබන යෝජනා අවම වශයෙන් මාසයකට වත් පෙර සාමාජිකත්වය වෙත ලබා දිය යුතුය.

## 7. මධ්‍යම කාරක සභාව

සම්මේලනය විසින් මධ්‍යම කාරක සභාවක් පත් කළ යුතු වේ. එසේ තෝරාගනු ලබන පළමු මධ්‍යම කාරක සභා රැස්වීසේදී පක්ෂයේ ලේකම්වරයා, සභාපති, භාණ්ඩාගාරික තෝරාපත්කර ගතයුතුය. එසේ සම්මේලන දෙකක් අතරතුර තීරණ ගැනීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වන අතර එය සාමාජික සාමාජිකාවන් 20 දෙනෙකුගෙන් සමන්විත යුතුය. මධ්‍යම කාරක සභාවේ අවම වශයෙන් තිදෙනෙක් සහෝදරියන් විය යුතුය.

සම්මේලන වාරයකදී නාමයෝජනා කැඳවා රහස් ඡන්දයකින් කුලක පදනම මත තෝරා පත් කරගත යුතුය. සම්මේලන දෙකක් අතරතුර ඇතිවෙන පුරප්පාඩු මධ්‍යම කාරක සභාව විසින් තෝරා පත් කරගත යුතුය. මෙහිදී මධ්‍යම කාරක සභාවට තරග වැද පරාජයට පත් වූ අයට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

මධ්‍යම කාරක සභා ක්‍රියාකාරීත්වය මණ්ඩල පහකින් සමන්විත විය යුතුය. සම්මේලයෙන් පසු පළමු රැස්වීම් වාරයේ දී සංවිධායක මණ්ඩලය හා අනෙකුත් මණ්ඩල ලේකම්වරුන්, සහ ඒවායෙහි සාමාජිකයන් ද පත්කළ යුතුය.

මධ්‍යම කාරක සභාව පැවැත්වීමට සාමාජිකයන්ගෙන් 1/3 ගණ පූරණයක් තිබිය යුතුය.

පිට පිට වාර තුනක් නොදන්වා මධ්‍යම කාරක සභාවට වාර්තා නොකරන සභිකයන්ගේ මධ්‍යම කාරක සභික ධූරය අහිමි කරනු ලබයි.

මධ්‍යම කාරක සභාව සඳහා දිස්ත්‍රික් ලේකම්වරුන් හට නිරීක්ෂණ මට්ටමෙන් සහභාගී විය හැක.

## 8. දේශපාලන මණ්ඩලය.

ස්ව කැමැත්තෙන් හෝ තනතුර අහිමිවීමේදී ඉදිරි සම්මේලනය තෙක් පුරප්පාඩු තනතුරු පත් කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතුවේ. මණ්ඩල පහේ ලේකම්වරුන් සමග තවත් මධ්‍යම කාරක සභිකයන් 06 ගෙන් දේශපාලන මණ්ඩලය සමන්විත විය යුතුය. කාන්තා නියෝජනයක් අනිවාර්යය වේ. දේශපාලන මණ්ඩලය සතිපතා රැස්විය යුතුය. සංධානයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වයන් සැළසුම් කිරීම, දේශපාලන වර්ධනයන්, අනතුරු, ඉදිරි දර්ශණය සැළසුම් කිරීම, ජාත්‍යන්තර කටයුතු පවත්වාගෙන යාම සහ සංවර්ධනය කිරීම. මධ්‍යම කාරක සභා දෙකක් අතරතුර තීන්දු ගැනීමේ බලය දේශපාලන මණ්ඩලයට, විධායක කාරක මණ්ඩලය ලෙස බලය පැවරේ.

## 9. සංවිධායක මණ්ඩලය

අයත් කාර්යය වන්නේ සාමාජිකත්වය නඩත්තු කිරීම, සංවිධායක ශාඛා පිහිටුවීම, දිස්ත්‍රික් සහ ශාඛා සංවිධාන ක්‍රියාකාරීත්වයන් මෙහෙයවීම සහ පසුවිපරම් කිරීම, සාමාජික ලේඛන පවත්වාගෙන යාම, උද්ඝෝෂණ හා ප්‍රචාරක වැඩ කටයුතු වේ.

## 10. මුදල් මණ්ඩලය

මුදල් ලේකම් හා තවත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. අරමුදල් රැස්කිරීම, සාමාජික මුදල් එකතු කිරීම, සංසදයේ සම්පත් ලේඛනයක් පවත්වාගෙන යාම, සම්පත් උපයා

සමාජවාදී ජනතා සංසදය
නො: 136, පන්සල පාර
කළුතර උතුර

CamScanner

ගැනීමේ සැළසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, මාසිකව මධ්‍යම කාරක සභාවට අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම.

සාමාජිකයන් හට ගිණුම් පොත් පරීක්ෂා කිරීමට අවශ්‍ය නම් සති 03 කට කළින් ඒ සඳහා ඉල්ලීම් කළ යුතුය. ඒ සඳහා සාමාජිකයන් අවම වශයෙන් 10 න් සමන්විත කණ්ඩායමක් විය යුතුය.

## 11. වෘත්තීය මණ්ඩලය

වෘත්තීය සමිති සහ කම්කරුවන් අතර කෙරෙන ක්‍රියාකාරීත්වයන් පිළිබඳ තීන්දු තීරණ ගැනීම මෙම මණ්ඩලයේ කාර්යයභාරයයි. වෘත්තීය ලේකම්ට අමතරව තවත් සාමාජිකයන් සිව්දෙනෙක් මෙහි සාමාජිකත්වය දරයි. මධ්‍යම කාරක සභාවට පිටස්තරව සිටින වෘත්තීය සමිති නායකයන් ඇතුලු කර ගැනීමට මණ්ඩලයට ඉඩ ඇත.

## 12. බහුජන මණ්ඩලය

බහුජන මණ්ඩල ලේකම් හා තවත් සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සමන්විය යුතුවේ. වෘත්තීය සමිති, ගොවි, ධීවර සහ ප්‍රජා මූල අරගලයන් සම්බන්ධීකරණය හා අරගල බිමේ නායකයන් දේශපාලනිකව දිනා ගැනීම සැළසුම් කිරීම.

## 13. අධ්‍යාපනය/ සන්නිවේදනය

දේශපාලන මණ්ඩලයේ මඟ පෙන්වීම අනුව සංවිධායක මණ්ඩලය විසින් කළ යුතුයි.

## 14. විනය කමිටුව

සම්මේලනය විසින් පත්කරනු ලබන තිදෙනෙකු ගෙන් සමන්විත ස්වාධීන මණ්ඩලයකි. සම්මේලන වාර දෙකක් අතර සංධානයේ විනය ප්‍රශ්න විභාග කිරීම හා තීන්දු මාස දෙකක් ඇතුළත ප්‍රකාශයට පත්කළ යුතුය. මණ්ඩලය සඳහා කාන්තා නියෝජනය අනිවාර්යය වේ.

## 15. විගණන කමිටුව

සංධානයේ ගණුදෙනු විගණනය කොට වාර්තා කිරීම සඳහා විගණන කමිටුවක් සම්මේලනය විසින් පත් කළ යුතුය.

## 16. තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම

පක්ෂයේ සියළුම සභාවල්වලදී සමාජිකයන්ට නිදහසේ තම අදහස් ප්‍රකාශ කිරීමට හා නව අදහස්වලට අනෙකුත් අය නම්මවා ගැනීමට පූර්ණ නිදහස ඇති අතර තීරණ ගැනීමේදී ඔහුගේ/ඇයගේ මතය අනුව ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට සෑම සාමාජිකයෙකුම බැඳී සිටී.

## 17. ව්‍යවස්ථා සංශෝධන

ව්‍යවස්ථාවේ යම් සංශෝධනයක් කළ හැක්කේ පක්ෂ සම්මේලනයකදී යෝජනා ස්ථිරත්වයෙනි. ඒ සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගෙන් 2/3 ක ඡන්දයක් අවශ්‍ය වේ.

සමාජවාදී ජනතා සංසදය
නො: 136, පන්සල පාර
කළුතර උතුර

ලේකම්

2024 අගෝස්තු 19

CamScanner